15

# කෝලම්හි රඟ දැක්වෙන ''ගම කතාව''

*ඩබ්ලිව්. ටී. එස්. මධුවන්ත* [1]
HU/2012/2272

අම්බලන්ගොඩ හිරේවත්ත පරම්පරාව විසින් රඟ දැක්වෙන කෝලම් මඩුවෙහි අපර රංගය තුළ රඟ දැක්වෙන ''ගම කතාව'' පිළිබඳ සමාලෝචනයක් කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ. ලංකාවේ දකුණු මුහුදබඩ ප්‍රදේශවල විශේෂයෙන් ගාල්ල, මාතර, අම්බලන්ගොඩ, බලපිටිය ආදී ප්‍රදේශවල ප්‍රසිද්ධ ව පවතින ගැමි නාටකයක් වශයෙන් කෝලම් නාටකය හඳුනාගත හැකිය. මෙකී කෝලම් නාටකය රඟ දැක්වෙන පරම්පරා කිහිපයක් හඳුනාගත හැකිය. උදාහරණ වශයෙන් උඩුපිල, මිරිස්ස, හිරේවත්ත, ජුවන්වඩු, ටුක්කා වඩු ආදී පරම්පරාවන් සඳහන් කළ හැකිය. ඒ අතර, අම්බලන්ගොඩ ප්‍රදේශයට අදාළව හිරේවත්ත, ජුවන්වඩු, ටුක්කාවඩු, පරම්පරාවන් දැක්විය හැකිය. ඉන්මාගේ පර්යේෂණයට අදාළ වන ''ගම කතාව'' ඉදිරිපත් වන හිරේවත්ත පරම්පරාව කෝලම් සම්ප්‍රදායෙහි සුවිශේෂී පරම්පරාවක් වන අතර හිරේවත්ත පරම්පරාවෙහි පමණක් ඒකී ''ගම කතාව'' ඉදිරිපත් කරනු ලබයි. මෙම ''ගම කතාව'' නම් කෝලමෙහි වන සමාජීය, සංස්කෘතික, දේශපාලනික තත්ත්වයන් හෙළිවන සංස්කෘතික අංගයක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන් ලංකාවේ දකුණු මුහුදුබඩ කලාපයේ ජන ජිවිතයේ ඇතුළත් ඇතැම් ආවේණික ලක්ෂණ ඒකී ''ගම කතාව'' නම් කෝලමෙහි ඉතා මැනවින් නිරූපණය කිරීමට හිරේවත්ත කෝලම්කරුවන් සමත් වී ඇත. එකල ගැමි ජීවිතයේ එක් පවුලක් තේමා වෙමින් ගොඩනැගෙන ''ගම කතාව'' කෝලමෙහි භාවිත නම්, වචන ඇසුරෙන් ඒකී සමාජ වටපිටාව අධ්‍යයනය කළ හැකිය. එසේම, එම චරිතයන්හි ඇති ජීව ගුණය එකී සමාජයේ මානුෂික හැඟීම්, අවශ්‍යතා, වුවමනාවල ඇති සරල බව පසක් වේ. එසේම භාවිත වෙස් මුහුණු උක්ත කරුණු කාරණා තීව්‍ර වන අයුරින් ඉතාමත් මැනවින් නිර්මාණය කිරීමට හිරේවත්ත පරම්පරාව සමත් වී ඇත. ගැමි සමාජයෙහි තිබූ අන්තර් පුද්ගල සබඳතා, සහජීවනය, ජිවන තත්ත්වයන් ප්‍රති නිර්මාණය කිරීම මෙන්ම පුද්ගල අඩුපාඩු, සමාජයේ සංශෝධනය විය යුතු තැන් පෙන්වා දෙමින් කෝලම්හි සමස්ත අරමුණු අතර ප්‍රධාන අරමුණක් වන සමාජ සංශෝධන කාර්යයට ඌණ පූර්ණයන් සැපයීම ''ගම කතාව'' හි ප්‍රධාන කාර්ය භාරයකි.

ප්‍රමුඛපදඃ කෝලම්, හිරේවත්ත පරම්පරාව, ගම කතාව

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*